# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1653/22 - 2010 මැයි 13 වැනි බ්‍රහස්පතින්දා - 2010.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාත් ආණ්ඩුකාරතුමිය විසින් කරනු ලබන පත්කිරීම්

දකුණු පළාත් ආණ්ඩුකාරවර නෙරංජලා පුෂ්පා කුමාරි බාලසූරිය වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අංක 154(ඊ)(5) වැනි ව්‍යවස්ථාව අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් සිල්වා මැතිතුමා විසින් දැනට දරන ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජල සම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍යාංශ විෂයන්වලට අමතරව අධ්‍යාපන හා සංස්කෘතික, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළඳ සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ විෂයන් සහ ඉඩම් හා ඉඩම් සංවර්ධන, වාරිමාර්ග, මහාමාර්ග, ප්‍රවෘත්ති සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ විෂයන් 2010 මාර්තු 04 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ගරු ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් සිල්වා මැතිතුමා වෙත පවරන ලද බව මෙයින් නිවේදනය කරමි.

නෙරංජලා පුෂ්පා කුමාරි බාලසූරිය,
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2010 මාර්තු මස 04 වැනි දින,
ගාල්ල, ඩික්සන් පාරේ,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.
05-727

1A - PG 001142 — 355 (2010/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.